උකුවෙල ප්‍රාදේශීය සභාව.
මාතලේ දිස්ත්‍රික්කය
-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 26 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 ජූලි 07 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 18 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය
--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට උකුවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු සුසාන භූමි 10 ක් හා පොදු ලිං 61 ක් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2014 ජූනි 25 දින මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යාංශයෙන් ඊ - නැණ පියස ව්‍යාපෘතියට ලැබී තිබුණු රු.594,061 ක වටිනාකමින් යුතු උපකරණ, එම වර්ෂයේදී පිළිසරු ව්‍යාපාතියෙන් ලැබී තිබූ රු.200,000 ක වටිනාකමින් යුත් සීවර් යන්ත්‍රය සහ 2015 වර්ෂය තුල මිලදී ගත් පුස්තකාල පොත්වල වටිනාකම වූ රු.230,992 ක් ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ) සභාවේ ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු සඳහා 2015 වර්ෂය තුල දරා තිබුණු රු.378,984 ක් සහ ඉකුත් වර්ෂයේදී දරා තිබූ රු.4,461,745 ක් වශයෙන් එකතුව රු.4,840,729 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඈ) 2015 දෙසැම්බර් 31 දිනට දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය ශේෂය රු.630,293 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) භූමි වෙන් කිරීමේ ගාස්තු ආදායම සහ උසාවි දඩ ආදායම පිළිවෙලින් රු.9,425 කින් හා රු.128,650 කින් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඊ) වර්ෂයට අදාළව ගෙවිය යුතු රු.78,094 ක් උපචිත වියදම් යටතේ ගිණුම්ගත නොකිරීම හේතුවෙන් වර්ෂයේ වියදම් සහ උපචිත වියදම් රු.78,094 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) ණයගැති ලේඛනය හා ශේෂ සනාථ කිරීමේ ලිපි අනුව, 2015 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.1,123,791 ක කර්මාන්ත ණයගැති ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඟ) වර්ෂය අවසානයට පැවති කසල බඳුන් 34 ක හා ගැල්වනයිස් බට 286 ක වටිනාකම පිළිවෙලින් රු.9,381 ක් හා රු.316,602 ක් සහ වටිනාකම හඳුනා නොගත් ආයුර්වේද බෙහෙත් ශාලා 2 හි ඉතිරි තොග ගිණුම්ගතකර නොතිබුණි.

(එ) ආදායම් විෂයයන් 2ක හා වියදම් විෂයයන් 7කට අදාලව ආදායම් හා වියදම් ගිණුමේ දක්වා ඇති වටිනාකම් සමග ජ'නල් සටහන් ගැලපූ පසු ලෙජර් ගිණුම්වල ශේෂයන් සැසඳීමේදී අසමානතා පැවති අතර එම අසමානතා හේතුවෙන් ආදායම් රු. 113,942ක් අඩුවෙන් හා වියදම් රු.1,218,183 ක් අඩුවෙන් දැක්වීම නිසා 2015 දෙසැම්බර් 31 දිනට ආදායම් වියදම් හා ගිණුමේ අතිරික්තය රු.1,104,241ක් අඩුවෙන් දැක්වුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්

----------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.49,896,952ක්වූ ගිණුම් විෂයයන් 08කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු.19,751,230 ක් වූ අසමානතාවයක් විය.

1.3.3 ලැබිය යුතු ගිණුම්

----------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 05ක එකතුව රු.2,825,232 ක්වූ අතර, වර්ෂ 05 කට වැඩි කාලයක් ඉක්මවූ රු.31,137 ක ශේෂයක්ද ඊට ඇතුළත්ව තිබුණි.

1.3.4 ගෙවිය යුතු ගිණුම්

----------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 02ක වටිනාකම රු.25,278,357ක්වූ අතර, වර්ෂ 01කට වැඩි 05ට අඩු කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින ශේෂවල එකතුව රු.4,590,591ක් විය.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

ගිණුම් විෂයයන් 10කට අදාළව ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.130,162,793 ක් වූ ගනුදෙනු සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.6 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

----------------------------------------------------

තැන්පත් කර වර්ෂ 02 ඉක්මවූ රු.195,291 ක වටිනාකමින් යුතු තැන්පතු 14 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 හා 572 නියමයන් අනුව කටයුතු කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.18,577,241 වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,192,387ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.12,384,854 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයට අදාළ ඉදිකිරීම් වියදම රු.31,156,163 ක් වූ අතර, පූර්ව වර්ෂයේදී එම වියදම රු.84,940,061 ක් වී තිබුණි. ඒ අනුව, ඉදිකිරීමේ වියදම් සියයට 63 කින් සමාලෝචිත වර්ෂයේදී අඩුවී තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 වරිපනම් බදු

2015 දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.634,083 ක්වූ අතර, එම ශේෂය තුල වර්ෂයකට වඩා වැඩි කාලයකට අයත්, රු.264,878 ක ශේෂ ඇතුළත් වී තිබුණි.

2.3.2 අක්කර බදු

2015 දෙසැම්බර් 31 දිනට හිඟහිටි අක්කර බදු ශේෂය රු.31,334ක් වූ අතර, ඉන් රු.31,138 ක ශේෂයක් වසර 6 ක කාලයක සිට අය නොවී පැවැතුණි.

2.3.3 ජල ගාස්තු

(අ) 2015 දෙසැම්බර් 31 දිනට හිඟහිටි ජල ගාස්තු ශේෂය රු.1,541,877 ක්වූ අතර, එම ශේෂයට වසරකට වඩා වැඩි කාලයක් ඉක්මවූ රු.325,540 ක ශේෂ ඇතුළත් වී තිබුණි.

(ආ) ජල බිල්පත් නොගෙවීම මත ජල සැපයුම් විසන්ධි කර තිබූ ජල පාරිභෝගිකයින් 294 දෙනෙකුගෙන් 2015 දෙසැම්බර් 31 දිනට රු.460,702ක මුදලක් අයවීමට තිබූ අතර, ඒ තුල වර්ෂ 1 කට වැඩි කාලයක සිට සැපයුම් විසන්ධි කළ ජල පාරිභෝගිකයින් 227 දෙනෙකුගෙන් අය කළයුතු රු.209,228 ක ශේෂයක්ද පැවතුණි.

(ඇ) ප්‍රාදේශීය සභාව සතුව ඇති ජල යෝජනා ක්‍රම 4 න් කඩුවෙල ජල යෝජනා ක්‍රමයේ ජල පාරිභෝගිකයින් 40 දෙනෙකුගෙන් ජල මනු සවි කිරීමෙන් තොරව රු.150 ක මාසික ස්ථාවර ගාස්තුවක් අයකර තිබූ අතර, ඉතිරි ජල යෝජනා ක්‍රම 03 හි ජල මනු අක්‍රීයවී තිබූ ජල පාරිභෝගිකයන් 25 කගෙන්ද ජල මනු අක්‍රීය වීම මතද, රු.150 ක මාසික ස්ථාවර ගාස්තු අයකර තිබූ නමුත්, ජල මනු සවි කිරීමට කටයුතු කර නොතිබුණි.

2.3.4 බදු කුලී

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරණු ලැබේ.

(අ) 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන මධ්‍යම පළාත් පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ විධිවිධාන අනුව A හා C වෙළඳ සංකීර්ණවල කඩ කාමර 20 කින් තක්සේරුගත

කුළිය අය නොකිරීම හේතුවෙන් 2011 ජනවාරි 01 දින සිට 2015 දෙසැම්බර් 31 දක්වා කාලයට අදාලව රු.621,000 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ආ) සභාව සතු B හා D වෙළඳ සංකීර්ණවල කඩ කාමර සඳහා තක්සේරුවක් ලබා ගැනීමෙන් තොරව කුලී මුදල් අයකර තිබුණි.

(ඇ) මස්කඩ වාර්ෂිකව ටෙන්ඩර් මඟින් බදුදීම කළයුතු වුවද, ටෙන්ඩර් කිරීමෙන් තොරව සභාව සතු අංක B – 01 දරන මස් කඩය රු.750 ක මාසික බදු කුලියක් මත 2013 නොවැම්බර් 19 දින සිට 2018 නොවැම්බර් 18 දක්වා වර්ෂ 15 ක කාලයකට දීර්ඝ කාලීනව බදු දී තිබුණි.

(ඇ) බදුකරුවන් විසින් සිය කඩ කාමර අතුරු බදුදීම් නොකළයුතු වුවද, සභාව සතු කඩ කාමර 10 ක් අතුරු බදු දී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මහජන පුස්තකාල සඳහා කාර්යාල කාර්ය සහායකවරුන්ගේ රාජකාරි අවශ්‍යතාවයක් නොවුවද, තැන්න හා ඕවිලිකන්ද පුස්තකාල 02 කට 2008 නොවැම්බර් 03 දින සිට කාර්යාල කාර්ය සහායකවරයෙක් අනුයුක්ත කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂය සඳහා වැටුප් හා දීමනා වශයෙන් රු.370,854 ක් ගෙවා තිබුණි.

(ආ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 07 ඡේදය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව තාවකාලික පදනම මත සේවකයින් දෙදෙනෙකු සේවයේ යොදවා රු.469,500 ක් දීමනා ලෙස ගෙවා තිබුණි.

(ඇ) විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් හා ස්ථාන මාරුවී ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.60,748 ක් හිඟ ණයශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ "ඉ" - නැණ පියස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2015 වර්ෂයේ ජූනි 25 දින රු.594,061ක් වටිනා අයිතම 10කට අයත් ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ඒකක 21ක් සභාව වෙත ලැබී තිබුණද, එම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබූ අතර, මේ යටතේ ලැබී තිබූ පරිගණක 02 ක් කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා යොදවාගෙන තිබුණි.

3.3 අවිධිමත් ගනුදෙනු

----------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මාතලේ මහා නගර සභාවේ නාගරික මන්ත්‍රීවරයෙකුද වන, සභාවේ මහජන පුස්තකාලයේ පුස්තකාල සහායක ලෙස සේවය කරන නිලධාරියෙකු පුස්තකාලයේ රාජකාරි සඳහා විධිමත්ව වාර්තා නොකර සහ රාජකාරි ඉටු නොකර තිබියදී 2013 සිට 2015 දෙසැම්බර් මස දක්වා කාල පරිච්ඡේදය සඳහා රු.827,172 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

(ආ) තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් නේවාසිකව රැඳීසිට වරිපනම් තක්සේරු කටයුතු සිදුකර තිබූ කාලය වූ 2014 සැප්තැම්බර් මස 01 දින සිට 2015 අප්‍රේල් 10 දින දක්වා නේවාසික කුලී, කම්කරු කුලී, ජලබිල් හා විදුලිබිල් සඳහා රු.1,128,415 ක් වැයකර තිබූ නමුත්, එම වරිපනම් තක්සේරු වාර්තා 2015 දෙසැම්බර් 31 දින වනවිටද ඉදිරිපත් කර නොතිබුණි.

3.4 ආර්ථික නොවන ගණුදෙනු

-----------------------------

(අ) සභාව සතු පැරණි ගොඩනැගිල්ල රු. 50,000 ක මාසික කුලියක් මත වර්ෂ 05ක කාලයකට බදුදීම සඳහා ලංකා සතොස ආයතනය සමඟ රු.30,000,000 මුදලකට 2012 ඔක්තෝබර් 25 දින ගිවිසුමකට එළඹ තිබුණද, 2013 ජනවාරි 15 දිනැති මහා සභා තීරණය අනුව එම පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කර තිබුණ බැවින් ඒ සඳහා දරා තිබූ රු 60,000ක නිතිඥ ගාස්තු නිෂ්ඵල වියදමක් විය.

(ආ) එකී සභා තීරණය අනුව එම ස්ථානයේ කඩ කාමර සහිත නව ගොඩනැගිල්ලක් ඉදිකිරිම සඳහා සැලසුම් හා ඇස්තමේන්තු සකස් කර ගැනීමේ කාර්යය දිස්ත්‍රික් ඉංජිනේරුවරයා මඟින් ඉටුකර ගැනීමට තීරණය කර තිබුණද, ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරව පෞද්ගලික ගෘහ නිර්මාණ ශිල්පියෙකු වෙත ප්‍රදානය කර උපදේශක සේවා ගාස්තු ලෙස රු.500,000 ක් ගෙවීම් කර ඇතත්, මෙම ගොඩනැගිල්ල ඉදි කිරීම අත්හැර දමා තිබුණි.

3.5 හඳුනාගත් අලාභ

-------------------

එක් ගමකට එක් වැඩක් වැඩසටහන යටතේ කර්මාන්තයක් සඳහා සභා අරමුදලින් ගෙවීම් කර ඇතත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කිසිදු මුදලක් ප්‍රතිපූර්ණය නොවීම හේතුවෙන් සභාවට රු.147,182 ක පාඩුවක් සිදුවී තිබුණි.

3.6 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පොදු වෙළඳපල භූමියේ කැටගල් ඇතිරීම සඳහා රු.169,125 ක මුදලකට කැටගල් 5500 ක් 2015 ජුලි මාසයේදී මිලදීගෙන තිබූ අතර, ඒ සඳහා මහා සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. මිලදීගෙන තිබුණු කැටගල් නියමිත ප්‍රමිතියෙන් පවතින බවට පිළිගත හැකි ආයතනයකින් ප්‍රමිති සහතිකයක් ලබාගෙන නොතිබුණු අතර, එම කැටගල් කර්මාන්තය සඳහා යොදා නොගෙන සභා භූමියේ ගොඩ ගසා තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ පතිංගොල්ල අලවතුවල මාර්ගය සංවර්ධනය කිරීම හා නඩත්තු කිරීමේ කර්මාන්තය ඍජු ශ්‍රම පදනම මත ඉටුකර තිබූ අතර ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 10 යටතේ දෙවන වර තාර ආලේපනය සඳහා වර්ග මීටර 2,250 ක් සඳහා රු.321,750 ක් ඇතුළත්කර තිබූ නමුත් 2015 ජුලි 20 පරීක්ෂණ දින වන විටද, දෙවනවර තාර ආලේපනය සිදුකර නොතිබුණු බැවින් මාර්ග තලයේ පැවැත්මට බාධාවක් වී තිබුණි.

(ඇ) 2014 වර්ෂයේදී කර්මාන්ත 02 ක් ඉටු කිරීම සඳහා කොන්ත්‍රාත්කාර සමිති 02 ක් වෙත රු.108,800ක අත්තිකාරම් මුදල් ගෙවා තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත්, එම කර්මාන්ත ආරම්භ කර නොතිබුණි.

3.7 ව්‍යාපෘති ප්‍රමාද කිරීම

---------------------

අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව, ඉටු කිරීමට අපේක්ෂිත කාර්යයන් ලෙස දක්වා තිබූ පැරණි ප්‍රාදේශීය සභාව පිහිටි භූමියේ ඉදිකිරීමට සැලසුම් කර ඇති වෙළඳ සංකීර්ණයේ රථගාල සහ බිම් මහල ඉදිකිරීම, උකුවෙල මහජන පුස්තකාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම, කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා සුදුසු වෙනත් ඉඩම් කොටසක් සපයා ගැනීම සහ උකුවෙල ප්‍රදේශයට ආදාහනාගාරයක පහසුකම් සැපයීම යන ව්‍යාපෘති හා කාර්යයන් ඉටුකර නොතිබුණි.

3.8 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතු වන ටොන් 03 ක් පමණ වන අපද්‍රව්‍ය සභාවේ ට්‍රැක්ටරයක් හා සේවකයින් යොදවා එකතු කර, එයින් වෙන් කරන ලද අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 1½ ක ප්‍රමාණයක් දෙමටගොල්ල කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේදී කොම්පෝස්ට් සකස්කිරීමට යොදාගෙන තිබුණු අතර, ඉතිරි අපද්‍රව්‍ය සභාව සතු උකුවෙල හා ඇල්කඩුව ප්‍රදේශයේ ඉඩම් 02 කට බැහැර කර පස්වලින් වසා දමා තිබුණි. මෙලෙස එකතු වන අපද්‍රව්‍යවලින් විශාල ප්‍රමාණයක් පරිසරයට හානි වන අයුරින් බැහැර කර තිබුණි.

4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

-----------------------------------------

4.1 අයවැය පාලනය

--------------------

(අ) සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සැළකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

(අ) ආදායම් විෂයයන් 18ක් සඳහා ඇස්තමේන්තුගත රු.111,566,000 ක ආදායම් කිසිවක් උපයාගෙන නොතිබුණු අතර, ආදායම් විෂයයන් 31 ක ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම අතර සියයට 37 සිට සියයට 425 දක්වා පරාසයක විචලනයන් පැවතුණි.

(ආ) වැය විෂයයන් 24 ක් සඳහා සලසාදී තිබුණු රු.4,171,000 ක ප්‍රතිපාදනවලින් කිසිදු වියදමක් නොදරා ඉතිරි කර තිබූ අතර, වැය විෂයයන් 47 කට අදාලව ශුද්ධ ප්‍රතිපාදනය හා තථ්‍ය වියදම අතර සියයට 40 සිට සියයට 99 දක්වා පරාසයක විචලනයන් පැවතුණි.

4.2 අභ්‍යන්තර විගණනය

--------------------------

අභ්‍යන්තර විගණනය සඳහා පත්කර තිබුණු නිලධාරියාට වෙනත් රාජකාරීන්ද පවරා තිබීම හේතුවෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුව නොතිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

------------------------------

නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

(අ) සභාව සතුව ඇල්කඩුව නගරයේ ඇති පැරණි පුස්තකාලය හා ආයුර්වේද බෙහෙත් ශාලාව පිහිටි ඉඩම හා ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබූ අතර සභාව සතු වාහන 03 ක් 2014 වර්ෂයේ සිට ධාවනයේ යෙදවීමට කටයුතු නොකර නිශ්ක්‍රීයව තබා තිබුණි.

(ආ) 2012 හා 2014 වර්ෂ තුල මිලදීගෙන තිබුණු රු.509,267ක වටිනාකමැති භාණ්ඩ ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ පැවතුණි.

(ඇ) 2014 වර්ෂයේදී පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබී තිබූ ගැල්වනයිස් බට 560 න් රු.316,602 ක් වටිනාකමින් යුතු බට 286 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන පැවතුණි.

5. පද්ධති හා පාලන

----------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ගබඩා පාලනය
(ඇ) ණයගැති හා ණයහිමි පාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) කොන්ත්‍රාත් පාලනය
(ඊ) අයවැය පාලනය